# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2087/82 - 2018 සැප්තැම්බර් මස 07 වැනි සිකුරාදා - 2018.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**වයඹ පළාතේ පළාත් සභාව**

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය

**39 වැනි වගන්තිය යටතේ වූ නියමය**

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ 39 වැනි වගන්තිය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් පරිසර විෂය භාර අමාත්‍ය, ධර්මසිරි දසනායක වන මම මේ නියමය මගින්

1. (i) දේශීය භාවිතය සඳහා සනකමින් මයික්‍රෝන විස්ස (20) හෝ ඊට අඩු පොලිතීන් හෝ යම් පොලිතීන් නිෂ්පාදන නිපදවීම ; හෝ

   (ii) සනකමින් මයික්‍රෝන විස්ස (20) හෝ ඊට අඩු පොලිතීන් හෝ යම් පොලිතීන් නිෂ්පාදන වයඹ පළාත තුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය, ප්‍රදර්ශනය, නොමිලේ ලබා දීම හෝ භාවිතය,

   තහනම් කරමි.

එසේ වුව ද, පහත උපලේඛනයේ නිශ්චිතව සඳහන් අවසර ලත් භාවිතයන් සඳහා සනකමින් මයික්‍රෝන විස්ස (20) හෝ ඊට අඩු පොලිතීන් හෝ පොලිතීන් නිෂ්පාදන, අධිකාරියේ පූර්ව අනුමැතිය සහිතව භාවිත කළ හැකි ය.

2. 2008 සැප්තැම්බර් 15 වැනි දින අංක 1567/4 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ වූ නියමය, ඒ යටතේ සිදු කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි, මෙයින් පරිච්ඡින්න කරන බවට ප්‍රකාශ කරමි.

මෙම නියමයේ කාර්යය සඳහා -

"අධිකාරිය" යන්නෙන් 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ ස්ථාපනය කරන ලද වයඹ පළාත් පරිසර අධිකාරිය අදහස් වේ.

"පොලිතීන්" යන්නෙන් සියලු ආකාරයේ පොලිඑතිලීන්, පොලිප්‍රොපිලීන්, පොලිස්ටයරීන්, පොලිවයිනයිල් ක්ලෝරයිඩ්, පොලිඑතිලින් ටෙරප්තලේට් හෝ ඒ හා සමාන වෙනත් අමුද්‍රව්‍යක් අදහස් වේ.

ධර්මසිරි දසනායක,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය සහ
මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය,
අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ
සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2018 අගෝස්තු මස 30 වැනි දින,
කුරුණෑගල,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

**අවසරලත් භාවිතයන්**

1. ලැමිනේට් කිරීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය භාවිතය :-

(අ) ලෝහ ආලේපිත හෝ හොලෝග්‍රැෆික වන හෝ නොවන පොලිඑතිලින් ටෙරප්තලේට් (PET) පටල;
(ආ) ලෝහ ආලේපිත හෝ පර්ලයිස්ඩ් (pearlized) වන හෝ නොවන පොලිප්‍රොපිලින් (PP) පටල ;
(ඇ) නයිලෝන් ;
(ඈ) හැඩ ගන්වන ලද පොලිප්‍රොපිලින් (CPP) හෝ ලෝහ ආලේපිත හැඩ ගන්වන ලද පොලිප්‍රොපිලින් (CPP);
(ඉ) පොලිවයිනයිල් ක්ලෝරයිඩ් (PVC);
(ඊ) පොලිඑතිලින් ටෙරප්තලේට් ග්ලයිකෝල් (PETG).

2. වෛද්‍ය විද්‍යාත්මක හෝ ඖෂධමය කාර්ය සඳහා වෙනත් යම් සුදුසු විකල්ප නොමැති අවස්ථාවලදී භාවිතය.

09 - 582/1

---

**වයඹ පළාතේ පළාත් සභාව**

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය

**39 වැනි වගන්තිය යටතේ වූ නියමය**

-

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ 39 වැනි වගන්තිය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් පරිසර විෂය භාර අමාත්‍ය, ධර්මසිරි දසනායක වන මම මේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කටයුතු තහනම් කරමි.

ධර්මසිරි දසනායක,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය සහ
මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය,
අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ
සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2018 අගෝස්තු මස 30 වැනි දින,
කුරුණෑගල,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

කටයුතු :

(i) දේශීය භාවිතය සඳහා පොලිතීන් අමුද්‍රව්‍යක් වන ආහාර දවටන නිපදවීම ; සහ

(ii) පොලිතීන් අමුද්‍රව්‍යක් ලෙස යොදා නිෂ්පාදිත ආහාර දවටන වයඹ පළාත තුල විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලයේ ලබා දීම, ප්‍රදර්ශනය හෝ භාවිතය.

මේ නියමයේ කාර්යය සඳහා -

"ආහාර දවටන" යන්නෙන්, ලන්ච් ෂීට් අදහස් වේ.

"පොලිතීන්" යන්නට, වැඩි ඝනත්වයෙන් යුත් පොලිඑතිලින්, අඩු ඝනත්වයෙන් යුත් පොලිඑතිලින් සහ පොලිප්‍රොපිලින් ද ඇතුළත් වේ.

09 - 582/2

**වයඹ පළාතේ පළාත් සභාව**

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය

**39 වැනි වගන්තිය යටතේ වූ නියමය**

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ 39 වැනි වගන්තිය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් පරිසර විෂය භාර අමාත්‍ය, ධර්මසිරි දසනායක වන මම මෙහි II උපලේඛනයේ නිශ්චිතව සඳහන් අයිතම හැර, මෙහි I උපලේඛනයේ නිශ්චිතව සඳහන් කටයුතු තහනම් කිරීමට මෙයින් නියම කරමි.

ධර්මසිරි දසනායක,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය සහ
මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය,
අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ
සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2018 අගෝස්තු මස 30 වැනි දින,
කුරුණෑගල,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*I වන උපලේඛනය*

කටයුතු :

(i) දේශීය භාවිතය සඳහා වැඩි ඝනත්වයෙන් යුතු පොලිඑතිලින් අමුද්‍රව්‍යක් වන යම් මලු නිෂ්පාදනය ; සහ

(ii) වැඩි ඝනත්වයෙන් යුතු පොලිඑතිලින් අමුද්‍රව්‍යක් ලෙස යොදා නිෂ්පාදිත යම් මලු වයඹ පළාත තුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලයේ ලබා දීම, ප්‍රදර්ශනය හෝ භාවිතය.

මෙම උපලේඛනයේ කාර්යය සඳහා වැඩි ඝනත්වයෙන් යුත් පොලිඑතිලින් අමුද්‍රව්‍යක් ලෙස යොදා නිෂ්පාදිත මලු යන්නෙන්, "සිලි සිලි බෑග්" වශයෙන් පොදුවේ හඳුන්වනු ලබන පාරිභෝගිකයන්ගේ මලු ද ඇතුලුව නිෂ්පාදන හෝ භාණ්ඩ රැගෙන යාමේ කාර්ය සඳහා අතÜ සහිත හෝ රහිත වන කුමන හෝ පරිමාණයකින් යුතු මලු අදහස් වේ.

*II වන උපලේඛනය*

නිදහස් කරන ලද අයිතම :

(1) පහත සඳහන් පරිමාණයෙන් හෝ ඊට ඉහළ පරිමාණයෙන් යුත් කසළ බහාලුම් මලු :
දිග - මිමී 600
පළල - මිමී 260
උස - මිමී 900

(2) පහත සඳහන් පරිමාණයෙන් හෝ ඊට ඉහළ පරිමාණයෙන් යුත් රෙදිපිළි බහාලුම් මලු :
දිග - මිමී 400
උස - මිමී 500

09 - 582/3

---

**වයඹ පළාතේ පළාත් සභාව**

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සමග කියවිය යුතු එම ප්‍රඥප්තියේ 27 හා 28 වගන්ති යටතේ වයඹ පළාත් පරිසර විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ධර්මසිරි දසනායක,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය සහ
මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය,
අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ
සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2018 අගෝස්තු මස 30 වැනි දින,
කුරුණෑගල,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**නියෝග**

1. මෙම නියෝග 2018 අංක 1 දරන පළාත් පාරිසරික (ප්ලාස්ටික් අඩංගු කසළ සහ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම තහනම් කිරීම) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. කිසිඳු තැනැත්තකු, ප්ලාස්ටික් අඩංගු කසළ හෝ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම, පිළිස්සීමට සැලැස්වීම, ඉඩ දීම හෝ අවසර දීම සිදු නොකළ යුතුය.

3. ඉහත නියෝග වලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර 60 වැනි වගන්තිය යටතේ දඬුවමකට යටත් විය යුතුය.

09 - 582/4

---

**වයඹ පළාතේ පළාත් සභාව**

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය

**39 වැනි වගන්තිය යටතේ වූ නියමය**

-

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ 39 වැනි වගන්තිය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් පරිසර විෂය භාර අමාත්‍ය, ධර්මසිරි දසනායක වන මම මෙම නියමය මගින්, වයඹ පළාත තුල සියලුම ආකාරයේ පොලිඑතිලින්, පොලිප්‍රොපිලින්, පොලිඑතිලින් නිෂ්පාදන හෝ පොලිප්‍රොපිලින් නිෂ්පාදන දේශපාලන, සමාජීය, ආගමික, ජාතික, සංස්කෘතික හෝ වෙනත් යම් උත්සව හෝ අවස්ථාවලදී සැරසිලි සඳහා භාවිතය තහනම් කරමි.

ධර්මසිරි දසනායක,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය සහ
මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය,
අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන ජලාපවහන සහ
සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2018 අගෝස්තු මස 30 වැනි දින,
කුරුණෑගල,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

09 - 582/5

---

**වයඹ පළාතේ පළාත් සභාව**

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය

**39 වැනි වගන්තිය යටතේ වූ නියමය**

1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ 39 වැනි වගන්තිය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් පරිසර විෂය භාර අමාත්‍ය, ධර්මසිරි දසනායක වන මම මෙම නියමය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කටයුතු තහනම් කරමි.

ධර්මසිරි දසනායක,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය සහ
මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය,
අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ
සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2018 අගෝස්තු මස 30 වැනි දින,
කුරුණෑගල,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

කටයුතු :

(i) දේශීය භාවිතය සඳහා ප්‍රසාරිත පොලිස්ටයරීන් වලින් ආහාර ඇසුරුම් පෙට්ටි, පිඟන්, කෝප්ප හා හැඳි නිෂ්පාදනය ; සහ

(ii) ප්‍රසාරිත පොලිස්ටයරීන් වලින් නිෂ්පාදිත ආහාර ඇසුරුම් පෙට්ටි, පිඟන්, කෝප්ප සහ හැඳි වයඹ පළාත තුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලයේ ලබා දීම, ප්‍රදර්ශනය හෝ භාවිතය.

මෙම නියමයේ කාර්යය සඳහා -

"ආහාර ඇසුරුම් පෙට්ටි" යන්නෙන් ආහාර බහාලන පෙට්ටි (Lunch Boxes) අදහස් වේ.

09 - 582/6

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.